පැමිණිලි පාර්ශවය : ඩබ්.එම්.අබේකෝන් මයා.,
"දසුන" මැදගම.
තෙප්පනාව.
කුරුවිට.

වගඋත්තර පාර්ශවය : 01. උ.පො.ප.ආර්.පී.යූ.ජේ. රාජපක්ෂ මයා.
පොලිස් ස්ථානය.
කුරුවිට.

02. උ.පො.ප.එච්.ටී.ගාමිණී ප්‍රේමතිලක මයා.
පොලිස් ස්ථානය.
කුරුවිට.

03. පො.කො.37324 පුෂ්පකුමාර මයා.
පොලිස් ස්ථානය.
කුරුවිට.

04. පො.ප.බී.ජේ.ජේ.පී.බමුණුසිංහ මයා.
පොලිස් ස්ථානය.
කුරුවිට.

05. ස්ථානාධිපති.
පොලිස් ස්ථානය.
කුරුවිට.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංක : එච්.ආර්.සී/1930/15**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

2015 මැයි 26 දින තමා සේවය නිමවී පැමිණිමේදී කුරුවිට පොලිස් ජීප් රථය නවතා කුරුවිට පොලිස් ස්ථානයට ගෙන ආ බවත් පසුව තමා සිර මැදිරියට දැමූ බවත්.

රාත්‍රී 11.00ට පමණ තම බිරිද තමා පිළිබඳව සොයා බලා පොලිස් ස්ථානයට ආ බවත් තම බිරිද රාත්‍රී රාජකාරි කළ නිලධාරි වෙතින් තමා රැගෙන ඒමට හේතුව විමසීමේදී එය නොදන්නා බව දැක්වූ බවත්. පසු දින උදෑසන අපරාධ අංශයේ ස්ථානාධිපති තමා කැඳවා සල්ලි පිළිබඳ විමසූ බවත් තමාට පරුෂ වචනයෙන් බැනවැදුණු බවත් තොරතුරු ලබා නොදුන් බවත් ගුටිකාලා මැරෙන්න වන බව දැන්වූ බවත්.

තම බිරිද පැමිණ විමසීමේදී ඇය එලවා ගත් බවත් තමාගේ හිතවත් නිලධාරියෙකු තමා එළියට ගෙන ගොස් මුහුණ සේදීමට අවස්ථාව දුන් බවත් පසුව අපරාධ අංශයේ රාජපක්ෂ හා සුදු උඩු රැවුල ඇති නිලධාරියෙකු තමාගෙන් කටඋත්තරයක් ගැනීමට උඩුමහලට ගෙන ගිය බවත් එහිදී " මිල්ලවිටිය ඒජන්සියේ සල්ලි උඹ තමයි ගත්තේ. අපිට උඹව සැකයි." යැයි කියා බැණ වැදුණු බවත්.

පසුව තමාගේ ඇඳුම් සියල්ල ගලවා යට ඇඳුම පිටින් තමා දණ ගැස්වූ බවත් තමාගේ දෑත් පිටුපසට කර තද වන සේ අතට මාංචු දැමූ බවත්. එස්ලෝන් බටයෙන් පිටට, ඇලයට හා පසු පෙදෙසට පහරදුන් බවත්. "රාජපක්ෂ රාළහාමි දන්නවා නැති දේවල් ගන්න" යයි දක්වමින් තමාට කොච්චි මිරිස් කරල් 10ක් විතර කැවූ බව.

තමාට අපහසු වූ බවත් එම අපහසුවට තමා පෙරළුණු බවත් නැවත බටයකින් තමාට පහරදුන් බවත්. එහිදී තමා බිම වැටුණු බවත්.

පසුව තමාගේ යට ඇඳුම ගලවා තමාට නැමට කියා නැවත තමාව කූඩුවට දැමූ බවත්.

තමාගේ බිරිද ඔවුන්ගෙන් "අපරාධ කරන්නේ ඇයිදැයි" විමසූ විට ඔවුන් තම බිරිද එලවා දැමූ බවත්. වැඩිදුරටත් දක්වා සිටියි. 2015.05.27 දින උදේ පො.ප.බමුණුසිංහ මහතා තමාට පරුෂ වචනයෙන් බැණවැදී " උඹ සොරකම් කරලා තියෙනවා මට හවසට ඇවිත් බලා ගන්නම්" යයි කිවූ බවත්.

එදින සවස නැවත පහර නොදුන් බවත් ඉන් පසු 28 වන දින තමාගෙන් ප්‍රකාශයක් ලබාගත් බවත් 2015.05.28 දින රත්නපුර රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත යොමු කළ බවත් තමාගේ තුවාල සටහන් කළ බවත්

පසු දින දක්වා තමා රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් පසුව පෙරට්ටුවකට තැබුව බවත් තමා හඳුනා නොගත් නිසා නිදහස් කළ බවත්ය.

නමුත් එම දින කිහිපය තුළ එම සිදුවීම නිසා තමා ඇතුළු දරු පවුල මානසික පීඩනයට පත් වූ බවත් වැඩිදුරටත් දක්වා සිටී. තමාට පහරදුන් නිලධාරීන් ලෙස එවකට අපරාධ අංශයේ ස්ථානාධිපති, උ.පො.ප.ගාමිණී සේනාරත්න හා රාජපක්ෂ යන නිලධාරීන් බව පැමිණිලිකරු වැඩිදුරටත් දක්වා සිටී.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :

ස්ථානාධිපති.

2015.05.22 වන දින හඳුනා නොගත් පුද්ගලයෙකු තම නිවසට ඇතුළු වූ බව දක්වා පුද්ගලයෙකු පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් කළ බවත් මෙම පැමිණිල්ල පිළිබඳව උ.පො.ප.ගාමිණී ප්‍රේමවර්ධන හා පො.ප. 37324 පුෂ්ප කුමාර නිලධාරීන් විසින් විමර්ශනය කර, මෙම මුදියන්සේලාගේ අබේකෝන් යන අය පැය 13.10ට අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කර ඇත. 2015.05.28 දින අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමු කර මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කළ බවත් ය.

පසුව 2015.05.29 දින හඳුනාගැනීමේ පෙරට්ටුව සඳහා රක්ෂිත බන්ධනාගාරගත කර එදිනම හඳුනාගැනීමේ පෙරට්ටුව පැවැත්වූ අතර සැකකරු පැමිණිලිකාරිය විසින් හඳුනා නොගත් බවත්. 2015.06.25 දින අධිකරණය මගින් මෙම සැකකරුට විරුද්ධව ප්‍රමාණවත් සාක්ෂි නොමැති බැවින් සැකකරු අධිකරණය මගින් මුදා හරින ලද අතර මෙම අපරාධය සම්බන්ධයෙන් ඉදිරියට කිසිදු නඩු පැවරුමක් නොකළ බවත් ය. මෙම සැකකරු නීති විරෝධී ලෙස රඳවා ගැනීමක් හෝ ඔහුට පහරදීමක් අත්අඩංගුවට ගත් නිලධාරීන් විසින් සිදු කර නොමැති බව දන්වා ඇත.

පො.කො.37324 පුෂ්ප කුමාර මහතා

2015.05.27 දින තමා කිසිදු අත්අඩංගුවට ගැනීමකට සහභාගී නොවූ බවත් ඊට පෙර දිනවල සොරකම් කිහිපයක් සොයා බැලීමට ගිය නමුත් 2015.05.27 සටහන් යොදා තිබූ නමුත් තමා කිසිදු ආකාරයකට පැමිණිලි විමර්ශනයකට නොගිය බවත් නමුත් මෙම සිද්ධියට අදාළව සැකකරුගෙන් ප්‍රකාශය 2015.05.27 දින සටහන් කළ බව දක්වා සිටී. තමා 2015.05.26 දින සිට 2015.05.28 දින දක්වා කිසිදු රාජකාරියට සහභාගී නොවූ බවයි.

**උ.පො.ප.ගාමිණි ප්‍රේමතිලක මහතා**

2015.05.22 දින සී.අයි.බී. 3 260/2012 යටතේ ගුරුවරියක් රාත්‍රියේ තම නිවසට යමෙකු පැමිණි බවට පැමිණිල්ලක් කළ බවත් එම පැමිණිල්ල විධිදු විමර්ශනයේදී ඊට ආසන්න නිවසක් ද බිඳ රත්තරන් බඩු හා මුදල් රැගෙන යාම සම්බන්ධව පැමිණිල්ලක් විමර්ශනය කළ බවත් .සුනඛයා නිවසත් ඉව කර එම නිවසට ගිය බවත් ඒ අනුව එකම පුද්ගලයෙකු එම නිවෙස් දෙකටම ගිය බවට කරුණු නිරීක්ෂණය වූ බවත් ඒ බව තහවුරු කර ගැනීමෙන් පසු මෙම පැමිණිලිකරු 2015.05.27 දින පැය 13.10ට අත්අඩංගුවට ගත් බවත් දක්වා සිටී. කිසිදු පහරදීමක් නොකළ බව දක්වයි.

**උ.පො.ප. රාජපක්ෂ මහතා**

මෙම සැකකරු අත්අඩංගුවට ගනු ලැබුවේ උ.පො.ප. ගාමිණි ප්‍රේමතිලක බවත් තමා උසාවිය භාරව කටයුතු කරන හෙයින් එම කටයුතු කළ බවත් අධිකරණ වෛද්‍ය වරයා වෙත ඉදිරිපත් කළ බවත් ඔහු විසින් දක්වන කරුණු මත නීති විරෝධී රදවා තබා ගැනීම හෝ ඔහුගේ මුහුණට මිරිස් කවරයක් දමා මුහුණට ඇල්ලීමක් සිදු නොකළ බවත් දක්වා සිටී.

**පො.ප. බමුණුසිංහ මහතා**

තමා 2015.05.27 දින රාජකාරි නොකළ බවත්. 2015.05.27 දින පැය 8.13ට තොරතුරු සටහන් පොතේ පිටු අංක 311ඡේද 4055 යටතේ පිටවීමේ සටහන් යොදා එදින විභාග වූ අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 44288 සඳහා පෙනී සිට 2015.05.28 දින ස්ථානයට සහභාගී වූ බවත් තමා නාමිකව ස්ථානාධිපති. අපරාධ අංශයේ රාජකාරි කළ බවත් දක්වා සිටී.

විමර්ශනය :

පැමිණිලි පාර්ශවයට අනුව දක්වා සිටිනුයේ 2015. මැයි 26 දින රාත්‍රී අත්අඩංගුවට ගෙන 2015.05.28 දින දක්වා පැය 24කට වැඩි කාලයක් නීති විරෝධී ලෙස කිසිදු හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන වධහිංසාවට ලක් කළ බවයි.

වගඋත්තරකරුවන් දක්වා සිටිනුයේ පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් අනුව රාත්‍රී නිවසකට පුද්ගලයෙකු ඇතුළුවීමට අදාළව සැකපිට මෙම පැමිණිලිකරු 2015.05.27 වන දින පැය 1.30ට අත්අඩංගුවට ගත් බවයි.

ඒ අනුව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ල පිළිබඳව අවධානය යොමු කිරීමේදී එහි උස මහත පෞෂ්ඨිමත් පුද්ගලයෙකු නිවස තුළට පැමිණි බවත් ඔහු මීට පෙර දැක නැති පුද්ගලයෙකු බව පැමිණිල්ලේ දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුගේ විමර්ශන සටහන් පිළිබඳව සළකා බැලීමේදී මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලිකරු එම පැමිණිල්ලට අදාළව අත්අඩංගුවට ගැනීමට කරුණු කිසිවක් විමර්ශනයේදී අනාවරණය වී ඇති බවට කරුණු නිරීක්ෂණය නොවේ.

හඳුනාගැනීමේ පෙරට්ටුවට තැබුවද පැමිණිලිකරු හඳුනා ගැනීමක් නොකිරීම මත පැමිණිලිකරු අධිකරණයෙන් මුදා හැර ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු දක්වනුයේ තමා 26 දින අත්අඩංගුවට ගෙන 28 දින දක්වා පොලිස් ස්ථානයේ පැය 24කට වඩා වැඩි කාලයක් ආහාර, නිවැසියන් සමග කිසිදු සංනිවේදනයකට ඉඩ නොතබා රඳවා සිටි බවයි.

වගඋත්තර පාර්ශවයට අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ 2015.05.27 ප.ව.1.00 වන අතර පැය15.10ට උපසේවකට භාර දී ඇත. ඉන් පසු පොලිස් ස්ථානයේ දෙවන සිර මැදිරියේ වෙනත් පිටස්තර පුද්ගලයන්ට නොපෙනෙන අයුරින් ඇද සිටි එකක් කුඩුවේ දොරට දමා ආවරණය කර තිබූ බවට සටහන් යොදා ඇති බව ලේඛන පරීක්ෂාවේදී (සී.අයි.බී.3/326/266) නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු දක්වනුයේ තමා 26 දින සිට පොලිස් ස්ථානයේ සිටියදී තම බිරිඳ 26 දින රාත්‍රී 11.00ට පොලිස් ස්ථානයට පැමිණි බවත් 2015.05.27 දින කසිප්පු පැකට් සමග පා පැදියකින් ගෙන යාමේදී මිල්ලවිටිය ප්‍රදේශයේදී පුද්ගලයෙකු පොලිස් ස්ථානයට ගෙන ආ බවත් ඔහු තමා සමග කතා කිරීමේදී ඔහු තමාට පැවසූ බවයි. ඒ අනුව අදාළ රඳවා ගැනීමේ ලේඛනය පරීක්ෂා කිරීමේදී තඩු බඩු ලේඛනය පරීක්ෂා කිරීමේදී මිල්ලවිටිය ප්‍රදේශයේ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුගේ සටහන් අනුව මෙම පුද්ගලයා වෙනම සිර මැදිරියක කිසිවෙකුටත් නොපෙනෙන ලෙස රඳවා සිටියේ නම් එදින පොලිස් භාරයේ සිටි පුද්ගලයෙකු පිළිබඳ දැන සිටීම ගැටළු සහගත වේ.

එසේම පැමිණිලිකරුගේ බිරිඳ විසින් මෙම වින්දිත හට රාජකාරි නිමවා නිවසට නොපැමිණීම පිළිබඳව විමසීමේදී කුරුවිට පොලිසියට ගිය බව දැනගැනීමට ලැබීම මත පොලිස් ස්ථානයට

ගිය බවත් එහිදී 2015. මැයි 26 දින පෙ.ව.11.20ට ස්වාමියාගේ මුදල් පසුම්බිය ඒ.ටී.එම්. කාඩ්පත හා ත්‍රිරෝද රථයේ යතුර හා රිදියෙන් සකස් කල මුද්ද ආදිය අත්සත් කර භාර ගත් බවට කරුණු දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

තවද වින්දිත සමඟ 2015.05.27 දින සිරමැදියේ සිටි පුද්ගලයෙකු වන ඩබ්.එම්. සුරවීර යන අය විසින් ලබාදුන් දිවුරුම් ප්‍රකාශය සැලකීමේදී එම දිවුරුම් ප්‍රකාශයේ දක්වා ඇත්තේ 2015.05.27 දින උදෑසන අත්අඩංගුවට ගෙන සිරමැදිරියට යොමු කිරීමේදී මෙම වින්දිත සිරමැදිරියේ සිටි බවත් ය. ඒ අනුව අදාළ ලේඛන පරීක්ෂා කිරීමේදී 27 වන දින 11.45ට මත්පැන් ලඟ තබාගැනීමට අදාළව අත්අඩංගුවට ගෙන ඩබ්.එම්.සුරවීර යන අයෙකු එදිනම 3.30ට ඇප මත මුදා හැර ඇති බව රඳවා තබා ගැනීමේ ලේඛන අනුව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන්ට අනුව පැය 15.10ට පොලිස් ස්ථානයට ඉදිරිපත් කල සැකකරුවෙකු වන වින්දිත 15.30ට ඇප මත මුදාහැරිය සැකකරුවෙකු පිළිබඳව දැන ගැනීමට ප්‍රශ්න සගගත වේ. එසේම වගඋත්තරකරුවන්ට අනුව කාටවත් නොපෙනෙන ලෙස සිරමැදිරියේ රඳවා සිටින සැකකරුවෙකු විනාඩි 20කදී තවත් සැකකරුවෙකු පිළිබඳව තොරතුරු දැනගැනීම ප්‍රායෝගික නොවේ. ඒ අනුව, මෙම අත්අඩංගුවට ගැනීම හා රඳවා තබාගැනීම පිළිබඳව පැමිණිලිකාර පාර්ශවය දක්වන කරුණු සනාථ කරයි.

13 (1) ව්‍යවස්ථාව මගින් නීතිය මගින් නියම කර ඇති කාර්ය පටිපාටියට අනුකූලව මිස පුද්ගලයෙකු තම පොලිස් භාරයේ රඳවා තබාගැනීමට පමණක් නොව පුද්ගලයින්ව සිරකිරීමට හෝ වෙනත් භෞතික සීමාවන් පැනවීම මගින් අත්අඩංගුවේ රඳවා ගැනීම තහනම් කරයි.

යම් පුද්ගලයෙකු නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුව ආසන්නතම තිසි අධිකරණයේ විනිසුරු වෙත ඉදිරියට යොමු නොකර ඔහුගේ නිදහස අහිමි කොට ඇත්නම් එහිදී 13(2) ව්‍යවස්ථාව උල්ලංඝනය වේ. ඒ අනුව මෙම වින්දිත අත්අඩංගුවට ගැනීමේදී ලද පැමිණිල්ල සාධාරණ පැමිණිල්ලක්ද යන්න තහවුරු කර ගැනීමකින් සිදු කර ඇත්ද අත්අඩංගුවට ගෙන ඇත්ද යන්න සළකා බැලිය යුතු ය.

<u>කපුගීකියන එ. හෙට්ටිආරච්චි සහ තවත් අය 2SLR 153</u> තීරණයේදී නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටිය යනු 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය මගින් නියම කරන කාර්ය පටිපාටිය හැර අන් කිසිවක් නොවේ යන්න තීරණය විය. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32(1) වගන්තියේ තුළ යම් නිලධාරියෙකුට වරෙන්තුවක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගත හැක්කේ යම් පුද්ගලයෙකුට එදිරිව සාධාරණ පැමිණිල්ලක් ඇති අවස්ථාවක හෝ සාධාරණ තොරතුරක් හෝ සාධාරණ සැකයක් පවතී නම් පමණක් බව මෙම වගන්තිය මගින් නියම කරයි.

ඒ අනුව මෙම වින්දිත අත්අඩංගුවට ගැනීමේදී හුදෙක් පොලිස් ස්ථානයට ලද පැමිණිල්ල මතම අත්අඩංගුවට ගෙන ඇති බව කරුණු තිරීක්ෂණය වී ඇත. එසේම වින්දිත පැමිණිලිකරු 2015.05.26 දින සිට 2015.05.28 දින දක්වා රඳවාගෙන සිටි බවටද කරුණු තහවුරුවීම තුලින් වින්දිත සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) හා 13(2) වගන්ති උල්ලංඝනය වී ඇති බව නිගමනය කරමු.

මීලගට පැමිණිලිකාර පාර්ශවය දක්වන වින්දිත වධහිංසාවට ලක් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීමේදී වින්දිත දක්වා ඇති කරුණ වන්නේ, 2015.05.26 දින අත්අඩංගුවට ගෙන නිවසේ කිසිවෙකු හා සන්නිවේදනය කිරීමට ඉඩ නොදී ආහාර ලබා නොදෙමින් තමා තිරුවත් කර පහරදුන් බවයි.

ඒ අනුව වින්දිත වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් ලැබෙන මූලික අයිතිවාසිකම් රැකවරණය කඩවී ඇත්ද යන්න පිළිබඳව අවධානය යොමු කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවට අනුව "කිසිම තැනැත්තෙකු වධහිංසාවට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය" යන්න වේ.

ඒ අනුව මෙහිදී 11 වන ව්‍යවස්ථාව ශාරීරික වධහිංසාවට පමණක් සීමා නොවන අතර එය මානසික විෂය පථයද අදාල කර ගනී. මේ පිළිබඳව <u>සිල්වා එ. සභාපති, පොහොර සංස්ථාව (1989)2SLR 373</u> නඩුවේදී අමරසිංහ විනිසුරුතුමා දක්වා ඇත්තේ "11 වන ව්‍යවස්ථාව විසින් අරමුණු කරන ලද සැලකිල්ල හුදෙක් ශාරීරික ප්‍රචණ්ඩත්වයට සීමා නොවියයුතුය. එමගින් ආත්මය සහ මනස යන විෂය පථය ද අදාළ කර ගනියි" යන්නය.

මෙම පැමිණිල්ලට අදාලව වින්දිත ප්‍රකාශයේ 2015.05.26 දින රාත්‍රියේ කිසිදු හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන නිවැසියන්ට දැනුම්දීමක් සිදු නොකර ආහාර පාන ලබා නොදෙමින් රඳවාගෙන තමාව තිරුවත් කර පහර දීම තුලින් වින්දිත වධහිංසාවට ලක් කල බවයි.

වින්දිත වැඩ නිම කරවා නිවසට ඒමේදී අත්අඩංගුවට ගත් බවත් වින්දිත හෝ නිවැසියන්ට සන්නිවේදනයක් කල බවට කිසිදු කරුණක් අනාවරණය නොවන අතර වින්දිතගේ බිරිද විසින් සොයා බැලීම අනුව පොලිසියට පැමිණි බව තිරීක්ෂණය වේ. ඒ බව දිව්රුම් ප්‍රකාශ මගින් තහවුරු කර ඇත.

<u>ප්‍රනාන්දු එදිරිව සිල්වා හා තවත් අය</u> නඩුවේදී නිදාගැනීම ඇතුළු සාමාන්‍ය ශාරීරික කර්තව්‍ය සහ අවශ්‍යතා ඉටු කිරීම සඳහා අවශ්‍ය ආහාර නොමැතිව සිටීම, ප්‍රමාණවත් ආහාර නොමැතිව සිටීම, එනම් මූලික පහසුකම් නොමැතිව සිටීම මෙන්ම වෙනත් අය හා කථා බහ කිරීමෙන් වළකා තිබීම

11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට දක්වා ඇත. එසේම ගුරුවරියක මෙන්ම වයසට පත්වූ වින්දිතගේ බිරිඳ දරුවනට සමාජීය වශයෙන් මෙම අත්අඩංගුවට ගැනීම තදබල කම්පණයක් වනවා නොඅනුමානය. සමාජයේ තිකැලැල් චාර්තාවත් සමග ජීවත්වන පුද්ගලයෙකු හා පවුලකට සාධාරණ තොරතුරක් නොමැතිව අත්අඩංගුවට ගැනීම හා රදවා ගැනීම පැය කිහිපයක් වුවද එය දීර්ඝ කාලීනව මානසිකව පවුලකට සිදුවන මානසික හා සාමාජීය බලපෑම තක්සේරු කිරීම අපහසු වනු ඇත.

එසේම වින්දිතව ඉදිරිපත් කල අධිකරණ වෛද්‍යවරයාගේ වෛද්‍ය වාර්තාවත් සලකා බැලීමේදී ඉතිහාසය ලෙස පොලිස් නිලධාරි මාංචු දමා පහර දුන් බව දක්වා ඇති අතර එහි තුවාලයන් 4ක් සටහන් වී ඇත.

එම තුවාලයන් හතර දකුණු හා මැනික්කටුව අසල තුවාල බව සටහන් වී ඇති අතර අධිකරණ වෛද්‍යවරයාගේ වෛද්‍ය මතය වී ඇත්තේ මෙම තුවාල ලබාදුන් රෝග ඉතිහාසය හා සැසදෙන බවයි.

එසේම වින්දිත දක්වන පහරදුන් ආකාරය හා තුවාල ද සැසදෙන බව කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ.

ඒ අනුව වින්දිත මානසික මෙන්ම කායික වධහිංසාවට ලක් වී ඇති බවද තහවුරු වේ.

මෙහිදී වින්දිතට පහරදුන් නිලධාරීන් නිශ්චිතව හඳුනාගැනීම කොමිෂන් සභාවට කරුණු දක්වා ඇත. එසේම අපරාධ අංශයේ ස්ථානාධිපති හා පොලිස් ස්ථානාධිපතිට මූලිකවම තම භාරයේ සිටින සැකකරුවන් පිළිබඳ වගකීම, සැකකරුවකුට අදාළ මූලික අවශ්‍යතා සැපයීම යන වගකීමෙන් මුදාහළ නොහැක.

**නිගමනය :**

ඒ අනුව ඉහත කරුණු අනුව වින්දිත වන ඩබ්.එම්.අබේකෝන් මහතා සම්බන්ධව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11, 13(1), 13(2) වන ව්‍යවස්ථා මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :**

1. 1, 2, 3, 4, 5 යන වගඋත්තරපාර්ශවයන් විසින් වින්දිත වෙත රු.50,000/-ක මුදලක් ලබාදීමටත්,

2. වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙත ද යොමු කරනු ලැබේ.

3. වධහිංසා පනත යටතේ නඩු පැවරීමට මෙහි පිටපතක් නීතිපතිවරයා වෙත ද යොමු කරනු ලැබේ.

2021.11 .26 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commission of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත් :- 1. නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 12.

2. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

සැ.යු:- අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

දි/-